“ඔබ අතරින් කිසිවකු වුළුෑ ගන්නා විට ඔහුගේ නාසය තුළට ජලය ගෙන ගොස් පසු ව නාසය සීරා පිරිසිදු කළ යුතුය. ඔබ අතරින් කිසිවකු (තම ශාරීරික අවශ්යතා ඉටු කිරීමෙන් පසු පිරිසිදු කිරීම සඳහා) ගල් භාවිත කරන්නේ ද ඔහු ඔත්තේ සංඛ්යාවක් භාවිතා කළ යුතුය

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: “ඔබ අතරින් කිසිවකු වුළුෑ ගන්නා විට ඔහුගේ නාසය තුළට ජලය ගෙන ගොස් පසු ව නාසය සීරා පිරිසිදු කළ යුතුය. ඔබ අතරින් කිසිවකු (තම ශාරීරික අවශ්යතා ඉටු කිරීමෙන් පසු පිරිසිදු කිරීම සඳහා) ගල් භාවිත කරන්නේ ද ඔහු ඔත්තේ සංඛ්යාවක් භාවිතා කළ යුතුය. ඔබ අතරින් කිසිවකු නින්දෙන් අවදි වූ විට තම දෙඅත් ජල භාජනයට දැමීමට පෙර සෝදා ගත යුතුයි. හේතුව සැබැවින්ම රාත්රියේ තම දෑත් පිහිටියේ කොතැනකදැ?යි ඔබ කිසිවෙකු නොදන්නා බැවිනි.” මුස්ලිම්
හි සඳහන් තවත් ප්රකාශයක: "ඔබ කිසිවෙකු හෝ නින්දෙන් අවදි වූ විට, ඔහු තම අත තුන්වරක් සෝදා හරින තෙක් භාජනය තුළට නො ගිල්විය යුතුය. සැබැවින්ම ඔහුගේ අත රාත්රියේ තිබුණේ කොතැනක දැයි නොදන්නා බැවිනි." [صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පිරිසිදු කිරීමේ ඇතැම් නීති පැහැදිළි කළහ. ඒවා අතරින්: පළමුවැන්න: කවරෙකු වුළූ ධෝවනය කළේ ද හුස්ම සමග තම නාසය තුළට ජලය ගලන්නට සළස්වා පසුව හුස්ම සමගම එය බැහැර කළ යුතුය. දෙවැන්න (මළ මූත්රා කළ පසු): ඉන් බැහැර වන අපිවිත්ර දෑ පිරිසිදු කිරීමටත් ජලයෙන් තොරව ගල් හෝ එවැනි වෙනත් දෙයකින් එය ඉවත් කිරීමටත් සිතන්නේ නම්, එය ඔත්තේ සංඛ්යාවකින් පිරිසිදු කළ යුතුය. එහි අවමය විය යුත්තේ වාර තුනකි. එහි උපරිම වනුයේ බැහැර වන දෑ ඉවත් කර එම ස්ථානය පිරිසිදු කිරීමය. තුන්වැන්න: කවරෙකු රාත්රී නින්දෙන් අවදි වූයේ ද, ඔහු වුළූ ධෝවනය සඳහා තම අත් එහි දමන්නට පෙර භාජනයට පිටතින් තුන් වරක් සෝදාගත යුතුය. සැබැවින්ම තම අත් රාත්රියේ කොතැනක තිබුණේ දැයි ඔහු නොදන්නා බැවිනි. එවිට අපවිත්ර දෑ ගැන බියක් ඇති වේ. ෂෙයිතාන් මිනිසාට හානිදායක හෝ ජලය අපිරිසිදු කරන දෑද එයට එකතු කළ හැක.

http://www.sunnah.global/hadeeth/si/show/3033